විගණන සේවා කොමිෂන් සභාව

කාර්යසාධන වාර්තාව

2025.01.01 – 2025.12.31

විගණන සේවා කොමිෂන් සභාව

අංක 415, කොටා පාර, රාජගිරිය.

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන සේවා කොමිෂන් සභාව

වැය ශීර්ෂ අංකය - 023

අන්තර්ගතය

01.ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03. වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

04.කාර්යසාධන දර්ශක

05.තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

06.මානව සම්පත් පැතිකඩ

07.අනුකූලතා වාර්තාව

පෙලගැස්ම

අනු අංකය	කාරණාව	පිටුව
1	ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය	
	1.1 හැදින්වීම	03
	1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු	04
	1.3 ප්‍රධාන කාර්යයන්	05
	1.4 සංවිධාන සටහන	06
2	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	
	2.1 වාර්ෂික ප්‍රගතිය	07-12
3	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	
	3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	13
	3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	14
	3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	15
	3.4 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	16
	3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	17
	3.6 විගණකාධිපතිවරයාගේ වාර්තාව	18-25
4	කාර්යසාධන දර්ශක	26
5	තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය	
	5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු හා ප්‍රගතිය	27-28
6	මානව සම්පත් පැතිකඩ	
	6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	29
	6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයෙහි බලපෑම	30
	6.3 මානව සම්පත් සංවර්ධනය	31
7	අනුකූලතා වාර්තාව	32-41

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ස්ථාපිත කරන ලද විගණන සේවා කොමිෂන් සභාව, එහි 153අ.(1) ප්‍රකාරව සභාපතිවරයා විය යුතු විගණකාධිපතිවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත්කරන ලද සාමාජිකයින් සිවු දෙනෙකුගෙන් සමන්විතය. සභාපතිවරයා සහ සාමාජිකයින් 2023.04.10 දින සිය ධූරයන්හී රාජකාරී භාර ගන්නා ලද අතර, එතැන් සිට විගණන සේවා කොමිෂන් සභාව සිය නිල රාජකාරි ආරම්භ කරන ලදි. විගණන සේවා කොමිෂන් සභාවෙහි සාමාජිකයන්ගේ ධූර කාලය වසර තුනකි.

විගණන සේවා කොමිෂන් සභාවේ සංයුතිය 2025.12.31 දිනට පහත පරිදි විය.

1. ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න මහතා (2025.04.08 දින දක්වා) - සභාපති
2. විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු එන්.එස්.රාජපක්ෂ මහතා - සාමාජික
3. විශ්‍රාමික අතිරේක විගණකාධිපති ඒ.එම්.ඩී.නයනකාන්ත මහතා - සාමාජික
4. විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති ජී.තෙවඥානන් මහතා - සාමාජික
5. විශ්‍රාමික ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි
   එන්.ගොඩකන්ද මහත්මිය - සාමාජික

2025.04.08 දින විගණන සේවා කොමිෂන් සභා සභාපති ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න මහතා විශ්‍රාම යාමෙන් අනතුරුව විගණකාධිපති තනතුරෙහි වැඩ බැලීම සඳහා පත් කරන ලද ජී.එච්.ඩී.ධර්මපාල මහතා විගණන සේවා කොමිෂන් සභාවෙහි සභාපති ලෙස 2025.12.06 දින දක්වා කටයුතු කරන ලදි.

<u>විගණන සේවා කොමිෂන් සභා රැස්වීම්</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ආ.(1) ප්‍රකාරව කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණ පූර්ණය එකී සභාවේ සාමාජිකයන් තුන්දෙනෙකු වේ. 2023.04.10 දිනෙන් ආරම්භ කරන ලද විගණන සේවා කොමිෂන් සභාවෙහි ධූර කාලය වසර තුනක් සඳහා බලපැවැත්වෙන අතර 2025.12.31 දින දක්වා පහත සඳහන් පරිදි රැස්වීම් පවත්වන්නට යෙදුණි.

2025.01.01- 2025.12.31 - රැස්වීම් වාර 22

කොමිෂන් සභාව සෑම මසකම අවම වශයෙන් එක් වරක් හෝ රැස්වන අතර සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන මසක් තුළදී රැස්වන වාර ගණන වෙනස් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඇ. ව්‍යවස්ථාවෙන් සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදනයන්ට අනුකූලව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයෙහි නිලධරයන්ගේ බඳවා ගැනීම්, පත් කිරීම්, උසස්කිරීම් , විනය කටයුතු, ස්ථාන මාරු කිරීම්, ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැන්වීම්, සේවයෙන් පහ කිරීම් සහ අභියාචනා සම්බන්ධ තීරණ ගැනීම් මෙකී රැස්වීම් වලදී සිදු කරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සහ ජාතික විගණන පනතෙහි නියමයන්ට අනුකූලව

මහජන බැඳියාව සහ වගවීම සඳහා කැප වූ

විශිෂ්ට විගණන සේවයක්

මෙහෙවර

වෘත්තීයමය භාවය, නිපුණත්වය සහ යහපාලනය පෙරදැරි කරගත්

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයක් ස්ථාපනය කිරීම තුලින්

රාජ්‍ය සම්පත් පිළිබඳ වගවීම සහතික කිරීම.

අපගේ අගයන්

- ස්වාධීනත්වය
- අපක්ෂපාතීත්වය
- අවංකභාවය
- නවෝත්පාදනය
- පාරදෘශ්‍යභාවය
- වගවීම
- වෘත්තීය නිපුණත්වය

1.3 විගණන සේවා කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන්

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඇ ව්‍යවස්ථාව මගින් හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන්)

I. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සමාජිකයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලය

II. අමාත්‍ය මණ්ඩලය විසින් විධිමත්ව කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවාගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම්වලට අදාළ රීති සකස් කිරීම

III. ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

IV. නීතිය මගින් සළකනු ලබන පරිදි වූ වෙනත් බලතල කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමේ බලය

V. කාර්ය සාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවකදී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ පරිදි සකස් කර ගැසට් පත්‍රයේ පළ කිරීම

VI. කොමිෂන් සභාවේ කටයුතුවලට සහාය දීම සඳහා කමිටු පත් කිරීම.

VII. ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වා දීම.

VIII. පනතේ විධිවිධාන සළසා ඇති කරුණු සඳහා රීති සැකසීම

IX. රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණයට අදාළ රීති සකස් කිරීම.

1.4 සංවිධාන සටහන



විගණන සේවා කොමිෂන් සභාව
ලේකම්
අතිරේක ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ
සහකාර ලේකම්
සහකාර ලේකම්
ගණකාධිකාරී
නීති නිලධාරි
සහකාර අධ්‍යක්ෂ
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
කළමනාකරණ සේවා නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සේවා නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සේවා නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සේවා නිලධාරි
කාර්යාල සේවක සේවය /රියදුරු

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. වාර්ෂික ප්‍රගතිය

2.1.1 විගණන සේවා කොමිෂන් සභා රැස්වීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ආ.(1) ප්‍රකාරව කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණ පූරණය එකී සභාවේ සාමාජිකයන් තුන්දෙනෙකු වේ. 2023.04.10 දිනෙන් ආරම්භ කරන ලද විගණන සේවා කොමිෂන් සභාවෙහි ධුර කාලය වසර තුනක් සඳහා බලපැවැත්වෙන අතර 2025.12.31 දින දක්වා පහත සඳහන් පරිදි රැස්වීම් පවත්වන්නට යෙදුණි.

2023.04.10-2023.12.31 - රැස්වීම් වාර 22

2024.01.01-2024.12.31 - රැස්වීම් වාර 27

2025.01.01-2025.12.31 - රැස්වීම් වාර 22

2.1.2 ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ තනතුරුවලට බඳවා ගැනීම් (2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා)

තනතුර	බඳවාගන්නා ලද සේවක සංඛ්‍යාව			කාර්ය සාධන ප්‍රතිශතය
	සෘජු (විවෘත)	සීමිත	ජ්‍යෙෂ්ඨතාවය	
ශ්‍රී ල.රා.වි.සේ. III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරී	-	593	-	100%

2.1.3 ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථිර කිරීම්

තනතුර	ඉල්ලීම් සංඛ්‍යාව	ස්ථිර කළ සංඛ්‍යාව	කාර්ය සාධන ප්‍රතිශතය
ශ්‍රී ල.රා.වි.සේ. III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරී	75	75	100%

2.1.4 ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ තනතුරු උසස්වීම් ලබා දීම

තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	උසස්වීම් ලබාදුන් සංඛ්‍යාව	කාර්ය සාධන ප්‍රතිශත
ශ්‍රී ල.රා.වි.සේ. III පන්තියේ I ශ්‍රේණිය - විගණන නිලධාරි	178	178	100%
ශ්‍රී ල.රා.වි.සේ. III පන්තියේ අධි ශ්‍රේණිය - සහකාර විගණන අධිකාරී	04	04	100%
ශ්‍රී ල.රා.වි.සේ. I පන්තිය - ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති	11	11	100%
ශ්‍රී ල.රා.වි.සේ විශේෂ ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති	06	06	100%
ශ්‍රී ල.රා.වි.සේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති	02	02	100%

2.1.5 ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ තනතුරුවල ස්ථාන මාරු කිරීම්

- වාර්ෂික

තනතුර	ස්ථාන මාරු කමිටු නිර්දේශ ප්‍රමාණය	සමාලෝචන කමිටු නිර්දේශ ප්‍රමාණය	අභියාචනා ඉදිරිපත් කිරීම	අභියාචනා		කාර්ය සාධන ප්‍රතිශතය
				ඉටුකළ	නොකළ	
ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සහකාර විගණකාධිපති/ විගණන අධිකාරී / සහකාර විගණන අධිකාරී / විගණන නිලධාරී	172	33	02	02		100%

- වාර්ෂික නොවන

තනතුර	අයදුම්පත් ලැබුණු ප්‍රමාණය	ස්ථානමාරු කරන ලද ප්‍රමාණය	කාර්ය සාධන ප්‍රතිශතය
ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරී	**27**	**27**	**100%**

2.1.6 ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ තනතුරුවල ඉල්ලා අස්වීම්/ මුදාහැරීම්/ විශ්‍රාම ගැනීම්

	අයදුම්පත් ලැබුණු ප්‍රමාණය	කාර්යය නිමකරන ලද ප්‍රමාණය	කාර්ය සාධන ප්‍රතිශතය
ඉල්ලා අස්වීම්	23	23	100%
මුදාහැරීම්	45	45	100%
විශ්‍රාම ගැනීම්	33	33	100%
තනතුර අතහැරයාම සම්බන්ධ අභියාචනා	02	02	100%

2.1.7 ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නිලධාරීන්ගේ විනය කටයුතු

	ඉල්ලීම් සංඛ්‍යාව	නියෝග නිකුත් කළ සංඛ්‍යාව	කාර්ය සාධන ප්‍රතිශතය
කරුණු සොයා බැලීම්	4	4	100%
මූලික විමර්ශන	3	3	100%
චෝදනා පත්‍ර	3	3	100%
විධිමත් විනය පරීක්ෂණ	2	2	100%
විනය නියෝග	3	3	100%

2.1.8 ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නිලධාරීන්ට අදාළව අභියාචනා/මහජන පැමිණිලි

	ලැබුණු ලිපි සංඛ්‍යාව	කටයුතු අවසන් ලිපි සංඛ්‍යාව	තවදුරටත් කටයුතු කෙරෙමින් පවතින ලිපි	කාර්ය සාධන ප්‍රතිශතය
අභියාචනා	26	26	0	100%
ජා.වි.පනතේ 4 (2) අනුව මහජන පැමිණිලි	22	21	01	95%
ජා.වි.කා. නිලධාරීන්ට එරෙහි මහජන පැමිණිලි	15	15	0	100%

2.1.9 2025 වර්ෂය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම

කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම ජාතික විගණන කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

2.1.10 නඩු කටයුතු

නඩු අංකය	විස්තරය	ඉටු කරන ලද කාර්යය	කාර්ය සාධන ප්‍රතිශතය
SC/FR/33/2024	ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාවේ ක්‍රියාත්මක දිනය සම්බන්ධව ඉදිරිපත් කරන ලද පෙත්සමකි.	විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙන් වන නිරීක්ෂණ නීතිපති වෙත ඉදිරිපත් කර ඇති අතර 2025 වර්ෂයේ දී පැවති නඩු වාර 2ක් සඳහා ද සහභාගී විය.	100%
SC/FR/49/2024	රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ශ්‍රී ලංකා විගණන සේවයේ විගණන අධිකාරි තනතුරට පත් කිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති පෙත්සමකි.	විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙන් වන නිරීක්ෂණ නීතිපති වෙත ඉදිරිපත් කර ඇති අතර 2025 වර්ෂයේ දී පැවති නඩු වාර 2ක් සඳහා ද සහභාගී විය.	100%
SC/FR/315/2023	රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ශ්‍රී ලංකා විගණන සේවයේ විගණන අධිකාරි තනතුරට පත් කිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති පෙත්සමකි.	විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙන් වන නිරීක්ෂණ නීතිපති වෙත ඉදිරිපත් කර ඇති අතර 2025 වර්ෂයේ දී පැවති නඩු වාර 2ක් සඳහා ද සහභාගී විය.	100%
SC/FR/58/2023	රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ශ්‍රී ලංකා විගණන සේවයේ සහකාර විගණකාධිපති තනතුරට පත් කිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති පෙත්සමකි.	විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙන් වන නිරීක්ෂණ නීතිපති වෙත ඉදිරිපත් කර ඇති අතර 2025 වර්ෂයේ දී පැවති නඩු වාර 1ක් සඳහා ද සහභාගී විය.	100%
SC/FR/46/2025	ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විගණන අධිකාරි තනතුරට සීමිත පදනමින් පත් කිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති පෙත්සමකි.	විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙන් වන නිරීක්ෂණ නීතිපති වෙත ඉදිරිපත් කර ඇති අතර 2025 වර්ෂයේ දී පැවති දෙවන නඩු වාරයේ දී ගරු අධිකරණය විසින් නඩුව නිශ්ප්‍රභ කරන ලදී.	100%
CA/766/2024 (Writ)	ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ නිලධරයන් I පන්තියට උසස් කිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති පෙත්සමකි.	විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙන් වන නිරීක්ෂණ නීතිපති වෙත ඉදිරිපත් කර ඇති අතර 2025 වර්ෂයේ දී පැවති නඩු වාර 5ක් සඳහා සහභාගී විය.	100%

2.1.11 පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය

නීති කෘත්‍යය අංකය	විස්තරය	ඉටු කරන ලද කාර්යය	කාර්ය සාධන ප්‍රතිශතය
AAT/1/2024(ASC)	ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාවේ ක්‍රියාත්මක දිනය සම්බන්ධව ඉදිරිපත් කරන ලද අභියාචනයකි.	2025 පෙබරවාරි 15 කැඳවීම් දිනයේ දී විනිශ්චය අධිකාරය විසින් මෙම අභියාචනය නිශ්ප්‍රභ කරන ලදී.	100%
AAT/1/2025(ASC)	රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ ශ්‍රී ලංකා විගණන සේවයට කරන ලද පත් කිරීමක් සම්බන්ධව ඉදිරිපත් කර ඇති අභියාචනයකි.	✓ මූලික විරෝධතා හා ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත. ✓ 2025 වර්ෂයේ පැවති කැඳවීම් වාර 2ක දී ගරු විනිශ්චය අධිකාරය ඉදිරියේ පෙනී සිටිමින් කරුණු දක්වා ඇත.	100%
AAT/2/2025(ASC)	කොමිෂන් සභාව විසින් ලබා දුන් විනය නියෝගයකට එරෙහිව ඉදිරිපත් කර ඇති අභියාචනයකි.	✓ මූලික විරෝධතා හා ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත. ✓ 2025 වර්ෂයේ පැවති කැඳවීම් වාර 2ක දී ගරු විනිශ්චය අධිකාරය ඉදිරියේ පෙනී සිටිමින් කරුණු දක්වා ඇත.	100%

2.1.12 මානව හිමිකම් කොමිෂන් සභාවට යොමු කර ඇති පැමිණිලි

නීති කෘත්‍යය අංකය	විස්තරය	ඉටු කරන ලද කාර්යය	කාර්ය සාධන ප්‍රතිශතය
HRC/HO/2763/25	මෙම කොමිෂන් සභාව විසින් ලබා දුන් විනය නියෝගයකට අදාළව ඉදිරිපත් කර ඇති පැමිණිල්ලකි.	මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තරකරුවන් වෙනුවෙන් ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත.	100%

2.1.13 වෙනත් ආයතනවල නෛතික කටයුතු සඳහා සහාය දැක්වීම්

නීති කෘත්‍යය අංකය	විස්තරය	ඉටු කරන ලද කාර්යය	කාර්ය සාධන ප්‍රතිශතය
ඒසී/3248/2024 බී-228	ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාව සකස් කිරීම සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පෙත්සමකි.	තොරතුරු ලබා දෙමින් අවශ්‍ය සහාය ලබා දෙන ලදී.	100%
ඒසී/0205/2025 බී-228	ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාව සකස් කිරීම සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පෙත්සමකි.	තොරතුරු ලබා දෙමින් අවශ්‍ය සහාය ලබා දෙන ලදී.	100%

2.1.14 2025 වර්ෂයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රගතිය

ආයතනයේ නම	**වැය විෂය අංකය**	**වියදම් විස්තරය**	**ප්‍රසම්පාදනය අවසන් කළ දිනය**	**ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය**
විගණන සේවා කොමිෂන් සභාව	1201	ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම	2025.12.31	100%
		ලිපිගොනු කවර මිලදී ගැනීම	2025.12.31	100%
		ටෝනර්(TN 2560 -1; TN 2480-1; Canon NPG 90-1; Pantum PC 211E-2) - 05	2025.12.31	100%
		Petty Cash Box	2025.09.18	100%
		රිබන් - Epson LQ - 2090 II - 01	2025.09.03	100%
		ලිපි ශීර්ෂ මිලදී ගැනීම	2025.02.17	100%
		Tender Box 01	2025.03.03	100%
	2102	කෑම මේසයක් මිලදී ගැනීම.	2025.02.17	100%
		ප්‍රාග්ධන වියදම් - යතුරු පුවරුව (Key Board) 01	2025.10.31	100%
		ප්‍රාග්ධන වියදම් - Pedestal Fan 04	2025.09.15	100%
		ප්‍රාග්ධන වියදම් - ලිපිගොනු - Cupboard 02	2025.09.19	100%
	1408	වාහන (කුලී පදනමට)	2025.07.14	100%
	1409(140)	පානීය ජල බෝතල්	2025..06.02	100%
	1405	2025 වර්ෂය සඳහා පවිත්‍රතා කටයුතු	2025.12.31	100%
	2103	ප්‍රාග්ධන වියදම් -Brother Printer 02	2025.12.31	100%

3. වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	තත්‍ය 2024 රු.	
-	<u>ආදායම් ලැබීම්</u>				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	789,689	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	789,689	
-	<u>ආදායම් නොවන ලැබීම්</u>				
-	භාණ්ඩාගාර අග්‍රිම		60,018,000	55,257,000	ඒසීඒ-3
-	තැන්පතු		58,625	98,443	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		1,463,810	510,683	ඒසීඒ-5
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**61,540,435**	**55,866,126**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**61,540,435**	**56,655,815**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		61,540,435	56,655,815	
	අඩු කළා : වියදම්				
-	<u>**පුනරාවර්තන වියදම්**</u>				
36,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	32,226,018	22,414,095	
40,350,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	26,093,598	24,326,903	ඒසීඒ-2(ii)
150,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	105,433	103,737	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
76,700,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**58,425,049**	**46,844,735**	
	<u>**මූලධන වියදම්**</u>				
300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
2,800,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	396,174	8,762,435	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
200,000	හැකියා වර්ධනය	14	159,500	446,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
3,300,000	**මුළු මූලධන වියදම් (උ)**		**555,674**	**9,208,435**	
	තැන්පතු ගෙවීම්		58,625	98,443	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		4,493,676	2,119,067	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**4,552,301**	**2,217,510**	
80,000,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		63,533,024	58,270,680	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(1,992,589)	(1,614,865)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(1,992,589)	(1,614,865)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			(1,992,589)	**(1,614,865)**	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	24,154,570	22,913,396
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	4,638,250	1,608,384
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	0	0
මුළු වත්කම්		**28,792,820**	**24,521,780**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		4,638,250	1,608,384
දේපළ පිරියත හා උපකරණ සංචිතය		24,154,570	22,913,396
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	0	0
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	0	0
මුළු වගකීම්		**28,792,820**	**24,521,780**

පිටු අංක..07.....සිට ...22... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...23.... සිට ...29... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම : H.M. Nandasena	නම :
තනතුර :	තනතුර : Additional Secretary Audit Service Commission	තනතුර : කේ. ශර්මිලා මනෝරි ගණකාධිකාරී (වැ.බ) විගණන සේවා කොමිෂන් සභාව
දිනය : 2026.02.26	දිනය : 2026.02.26	දිනය : 2026.02.26

ඩී.කේ. විජේසිංහ
ලේකම්
විගණන සේවා කොමිෂන් සභාව

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ජ්සිජ්-සි

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තතය	
	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		789,689
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,505,504	-
අග්‍රිම ලැබීම්	60,018,000	55,257,000
අත්තිකාරම් අයකර ගැනීම්	1,916,745	510,683
තැන්පතු ලැබීම්	58,625	98,443
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**63,498,874**	**56,655,815**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	58,285,466	46,740,998
සහනාධාර සහ මාරුකිරීම්	105,433	103,737
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම,	159,500	-
අත්තිකාරම් ගෙවීම්	4,493,676	504,202
තැන්පතු ගෙවීම්	58,625	98,443
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**63,102,700**	**47,447,380**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**396,174**	**9,208,435**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර	396,174	9,208,435
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**396,174**	**9,208,435**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(396,174)**	**(9,208,435)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	0	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඹ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	**76,700,000.00**	**76,700,000.00**	**58,425,049.00**	**76.17**
ප්‍රාග්ධන	**3,300,000.00**	**3,300,000.00**	**555,674.00**	**16.83**
එකතුව	**80,000,000.00**	**80,000,000.00**	**58,980,723.00**	**73.72**

3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	**24,154,570.00**	**24,154,570.00**		
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.6 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/C/ASC /2/25/15 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 26 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
විගණන සේවා කොමිෂන් සභාව

ශීර්ෂය 023 - විගණන සේවා කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 023 - විගණන සේවා කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විගණන සේවා කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව විගණන සේවා කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව විගණන සේවා කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව විගණන සේවා කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව විගණන සේවා කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණනය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්

කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව 2025 වර්ෂයේදී වියදම් ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 06 ක එකතුව රු.3,480,000 ක් හා මූලධන වැය විෂයයන් 02 ක එකතුව රු.800,000 ක වශයෙන් එකතුව රු.4,280,000 ක මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදලම ඉතිරි වී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 11 ක එකතුව රු.8,977,666 ක් සහ මූලධන වැය විෂයයන් 03 ක රු.1,944,326 ක් වශයෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට 96 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලසුම්කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ අනුමත කිරීමක් සිදු නොකරන ලද හා ඉහත චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ අංක 12 (අ), (ආ), (ඉ) සහ (ඊ) ප්‍රකාරව කරුණු අන්තර්ගත නොකරන ලද සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරකම් පමණක් ඇතුලත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 කාර්යසාධනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (ඇ) ව්‍යවස්ථාව මඟින් හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව විගණන සේවා කොමිෂන් සභාව වෙත පැවරී තිබුණු කාර්යයන් ඉටු කිරීම පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(ඇ) ව්‍යවස්ථාව අනුව කොමිෂන් සභාව විසින් ඉටුකලයුතු කාර්යයන් වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් විධිමත්ව කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවාගැනීමේ පරිපාටි, පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් වලට අදාල රීති සකස්කර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 48 ඡේදය ප්‍රකාරව දක්වා ඇති පියවරයන් හා ක්‍රියා පිළිවෙත් අනුගමනය කර අදාල අනුමැතීන් ලබාගත යුතු වුවද 2025 දෙසැම්බර් 31 දින වන විට එම රීති සකස් කිරීම අවසන් කර තිබුණද ක්‍රියාත්මක තත්ත්වයට පත් වී නොතිබුණි.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 5(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කාර්යසාධන, පාරිසරික හා තාක්ෂණික විගණනය හා හඳුනාගත් වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවකදී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධාන මඟින් තීරණය කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ පරිදි සකස් කර ගැසට් පත්‍රයේ පල කිරීම සිදුකල යුතු බව දක්වා තිබුණද, 2024 වර්ෂයේදී කාර්යසාධන විගණනය සඳහා පමණක් වන පරිදි මාර්ගෝපදේශ සකස් කර ගැසට් පත්‍රයේ පළකර තිබුණි.

(ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 47 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය සහ විගණනය පිළිබඳ ක්ෂේත්‍රයේ මානව සම්පත් හැකියාව වැඩිදියුණු කිරීමේ අදහස ඇතිව විගණන කාර්යාලය යටතේ රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතු බවත්, මධ්‍යස්ථානයේ කලමනාකරණයට අදාල රීති කොමිෂන් සභාව විසින් සකස් කල යුතු බව දක්වා තිබුණු නමුත් එවැනි පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයක් ජාතික විගණන කාර්යාලය විසින් පිහිටුවා නොතිබුණු බැවින් ඊට අදාල රීති සකස් කිරීම සඳහා විගණන සේවා කොමිෂන් සභාවට ක්‍රියාකාරී වීමට නොහැකිවී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාව සම්බන්ධිත හා අනුශාංගික කරුණුවලට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී විගණන සේවා කොමිෂන් සභාව වගඋත්තරකරු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුකර 04ක් හා අභියාචනාධිකරණයේ නඩුකර (රිට්) 01ක් ගොනුකර තිබුණ අතර එම නීති කෘත්‍යයන් 2025 වර්ෂය අවසාන වනතෙක් විභාග වෙමින් පැවතුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීමට පෙර සේවාවන්ට අදාලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්ගෙන ඇති තීරණයකට එරෙහිව එක් අභියාචනාවක් හා විගණන සේවා කොමිෂන් සභාව විසින් ගෙන ඇති තීරණයකට එරෙහිව අභියාචනාවක් වශයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අභියාචනා 02ක් විභාගවෙමින් පැවතුණි.

(ඊ) විගණන සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් විනය නියෝගයකට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි 01 ක් යොමුකර තිබුණි.

4.3 ප්‍රසම්පාදනයන්

(අ) 2025 වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර තිබුණද, 2025 ජනවාරි 01 දින සිට බලාත්මක වන 2024 භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා පිලිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 04 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති ඇමුණුම්හි සඳහන් ආකෘතීන්ට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (MPP), සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම (DAPP), පූර්ව සූදානම් සැලැස්ම (PP) සහ ප්‍රසම්පාදන කාලසටහන(PTS) පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක අයවැයගත ප්‍රතිපාදන ප්‍රමාණයන්, ප්‍රසම්පාදන සැලසුමේ දැක්වෙන ඇස්තමේන්තු හා සැසඳීමේදී එකතුව රු.1,805,000 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් වැය විෂයයන් දෙකක අයවැය ප්‍රතිපාදන එකතුව රු.800,000 ක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සිදු කල මුළු වටිනාකම රු.295,271ක් වූ ප්‍රසම්පාදන කටයුතු 04ක් වෙනුවෙන් 2024 භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා පිලිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ හා අත්පොතෙහි 2.5 සහ 2.6 අනුව භාර ගැනීමේ කමිටු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

(අ) 2024 පෙබරවාරි 14 දින සිට 2026 පෙබරවාරි 14 දක්වා වසර 02 ක කාලයක් සඳහා මාසික කුලිය රු.318,600 කට (වැට් සහිත) වෑන් රථයක් හා 2024 මැයි 14 දින සිට 2025 මැයි 13 දක්වා වසරක කාලයක් සඳහා මාසික කුලිය රු.295,000 කට (වැට් සහිත) මෝටර්රථයක් මාසික ධාවන කිලෝමීටර් 3000 ක සීමාව යටතේ මෙහෙයුම් බදු පදනම මත පුද්ගලික ආයතන වෙතින් ලබාගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ රියදුරු තනතුරු 05 ක් තිබුණද කොන්ත්‍රාත් පදනම මත එක් රියදුරෙකු පමණක් සේවයේ නියුක්තව සිට, එම රියදුරුද සේවයෙන් ඉවත්වීම නිසා 2026 ජූනි 09 දින කොන්ත්‍රාත් පදනම මත නව රියදුරෙකු බඳවා ගන්නා තෙක් වෑන් රථය 2025 මාර්තු මාසයේ සිට 2025 මැයි මාසය අවසානය දක්වා ධාවනය නොකර නිශ්කාර්යව පැවතියද එම කාල පරිච්ඡේදයට අදාල මාසික බදු කුලිය ලෙස එකතුව රු.955,800 ක් අදාල ආයතනය වෙත ගෙවා තිබුණි.

(ii) වසරක කාලයක් සඳහා ලබාගෙන ඇති මෝටර් රථයේ සේවා ගිවිසුම අවසන් වීමෙන් පසු, ප්‍රසම්පාදන කාර්යයන් සිදුකර නව සේවා ගිවිසුමකට එළඹීමකින් තොරව එම ආයතනය සමඟම 2025 මැයි සිට 2025 ජූලි දක්වා එක් අවස්ථාවකදී මාසය බැගින් මාස දෙකක කාලයක් සඳහා අවස්ථා දෙකකදී ගිවිසුම දීර්ඝ කර තිබුණි.

(ආ) 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ පොදු 66 ආකෘතිය සහ CIGAS පද්ධතියෙහි ස්ථාවර වත්කම් යටතේ වන BOS Report එකිනෙක හා සැසඳීමේදී වත්කම් අයිතම 18කට අදාලව වත්කම් 44 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

5. යහපාලනය

5.1 විගණන හා කළමනාකරණ කමිටුව

2025 අප්‍රේල් 28 දිනැති DMA/01/2025 අංක දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව සෑම කාර්තුවක් තුළම එක් රැස්වීමක් වන පරිදි අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් ප්‍රර්වතන වර්ෂයට අදාළව පැවැත්විය යුතු වුවද 2025 වර්ෂයේදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 මානව සම්පත් සංවර්ධන සැලැස්ම

2025 වර්ෂය සඳහා මානව සම්පත් සැලසුම අනුව පුහුණු වැඩසටහන් 30 ක් ලබා දීමට සැලසුම් කර තිබුණද වැඩසටහන් 25ක් පවත්වා නොතිබුණි.

6.2 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2025 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව30 ක් එනම් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 63 ක් විය.මෙම පුරප්පාඩු සංඛ්‍යාව තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06, තෘතීය මට්ටමේ පුරප්පාඩු 04 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 12 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් විය.

(ආ) බඳවාගැනීමේ පරිපාටිය අනුව ස්ථිර සේවයට පත් කර ගැනීම වෙනුවට ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 න් පුරප්පාඩු 02 ක් සඳහා වැඩබැලීමේ පදනම මත නිලධාරීන් දෙදෙනෙකු හා රාජකාරි ඉටු කිරීම සඳහා එක් නිලධාරියෙකුද අනුයුක්ත කර තිබූ අතර ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 03 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. මෙම තත්ත්වය සභාවේ කාර්යසාධනය කෙරෙහි බලපෑමට ඉඩ ඇති බව නිරීක්ෂණය කෙරේ.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4. කාර්යසාධන දර්ශක

පාලන අංශයෙහි ප්‍රගතිය

විශේෂිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස		
	100 % – 90 %	**89 %– 75 %**	**50% – 74 %**
පුද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර පවත්වාගෙන යාම	✓		
ආයතනයේ වාර්තා සකස් කිරිම	✓		
තොරතුරු දැනගැනීමේ පනතට අනුකූලව කටයුතු කිරීම	✓		
නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා ලබාදිම	✓		
වෙනත් * කාර්යාලීය හැඳුනුම්පත් සකස් කිරීම * දුම්රිය වාර ප්‍රවේශපත්‍ර සහ දුම්රිය බලපත්‍ර * අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ	✓		

ගිණුම් අංශයෙහි ප්‍රගතිය

විශේෂිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස		
	100 % – 90 %	**89 %– 75 %**	**50% – 74 %**
කාර්යක්ෂම මූල්‍ය පරිපාලනය සහ නිවැරදි ගිණුම්	✓		
නිවැරදි වාර්තාකරණය	✓		
මූල්‍ය වත්කම් ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම	✓		

පත් කිරිම්/උසස්කිරීම්/විනය අංශයෙහි ප්‍රගතිය

විශේෂිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස		
	100 % – 90 %	**89 %– 75 %**	**50% – 74 %**
ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම	✓		
ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නිලධාරින්ගේ ශ්‍රේණිගත උසස්කිරිම් සිදු කිරිම	✓		
ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථානමාරු හා අභියාචනා	✓		
ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමට අදාළ අනුමැතිය ලබාදීම	✓		

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු හා ප්‍රගතිය

අනු අංකය	අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ළඟා කරගෙන ඇති ප්‍රගතිය			අදාළ අංශය
				0%-49%	50%-74%	75%-100%	
01	**8.** සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	**8.2** නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම	ආයතනයේ මානව සම්පත් ඵලදායීතාවය වැඩිකිරීමට පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව			✓	පාලන
			ජාත්‍යන්තර දැනුම පිරිපුන් නිලධාරීන් පිරිසක් ඇති කිරීම සඳහා ආයතනයේ නිලධාරීන් වෙනුවෙන් ලබා දුන් කෙටිකාලීන/දිගුකාලීන පුහුණු සංඛ්‍යාව			✓	
02	**12.** තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් තහවුරු කිරීම	**12.7** ජාතික ප්‍රමුඛතාවයන් අනුව තිරසර මහජන ප්‍රතිසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම් සඳහා ආයතනය සතුව පවතින සම්පත් පූර්ණ ධාරිතාවයෙන් යුතුව පවත්වාගෙන යාම	ප්‍රසම්පාදන කටයුතු සඳහා අයවැය අරමුදල් උපයෝජන ප්‍රතිශතය		✓		ගිණුම්

අනු අංකය	අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ලබා කරගෙන ඇති ප්‍රගතිය			අදාළ අංශය
				0%-49%	**50%-74%**	**75%-100%**	
03	**16.** තිරසර සංවර්ධනය සඳහා වූ සාමකාමී හා අන්තර්ග්‍රහණය වූ සමාජ ප්‍රවර්ධනය හා සැමට සාධාරණත්වය සඳහා ප්‍රවේශය සැපයීම හා වගවීමක් සහිත හා අන්තර්ග්‍රහණය වූ ආයතන ඇති කිරීම	**16.6** සෑම මට්ටමකින්ම ඵලදායී, වගවීම සහ විනිවිදභාවයෙන් යුතුව සංවර්ධනය කිරීම	නියමිත කාලය තුළ අයවැය ඇස්තමේන්තු මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම			✓	ගිණුම්
			පෙබරවාරි 28 දින හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම			✓	ගිණුම්
			පෙබරවාරි 28 දින හෝ ඊට පෙර අත්තිකාරම් බී ගිණුම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම			✓	ගිණුම්
			01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කිරීම			✓	ගිණුම්
		16.7 සියළුම මට්ටම් වලදී ප්‍රතිචාරාත්මක, සියළුදෙනා අන්තර්ගත වූ සහභාගිත්වයෙන් යුතු සහ නියෝජනයෙන් යුතු තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම	ආයතනයේ ස්ත්‍රී පුරුෂ වශයෙන් හා වයස් මට්ටම අනුව විධායක තනතුරු බෙදී ගොස් ඇති ප්‍රමාණය			✓	පාලන
			ආයතනයේ ස්ත්‍රී පුරුෂ වශයෙන් හා වයස් මට්ටම අනුව විධායක නොවන තනතුරු බෙදී ගොස් ඇති ප්‍රමාණය		✓		පාලන
		16.10 ජාතික නීති පද්ධතියට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ කාර්යක්ෂම හා විනිවිදභාවයකින් යුතු රාජ්‍ය සේවයක් පවත්වාගෙන යාම	තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ලද ඉල්ලීම් සංඛ්‍යාව			✓	පාලන
			ලැබෙන ලද මහජන පැමිණිලි අතුරින් විසඳීම සඳහා මූලික පියවර ගන්නා ලද ඉල්ලීම් සංඛ්‍යාව			✓	පාලන

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)
ජ්‍යෝෂ්ඨ	10	04	06
තෘතීයික	05	01	04
ද්විතීයික	21	12	09
ප්‍රාථමික	12	04	08
	48	21	27

විගණන සේවා කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති මුළු තනතුරු සංඛ්‍යාව සහ 2025.12.31 දිනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු

තනතුරේ ස්වභාවය	තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෝෂ්ඨ මට්ටම	ලේකම්	01	01	06
	අතිරේක ලේකම්	01	01	
	ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම්	01	01	
	අධ්‍යක්ෂ	01	01	
	සහකාර අධ්‍යක්ෂ	01	0	
	සහකාර ලේකම්	02	0	
	ගණකාධිකාරී	01	0	
	අභ්‍යන්තර විගණක	01	0	
	නීති නිලධාරී (දෙපාර්තමේන්තුගත)	01	0	
තෘතීය මට්ටම	පරිපාලන නිලධාරී	01	01	04
	භාෂා පරිවර්තක	03	0	
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	01	0	
ද්විතීය මට්ටම	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	01	0	09
	කළමනාකරණ සේවා නිලධාරී සේවය	15	11	
	සංවර්ධන නිලධාරී	05	01	
ප්‍රාථමික මට්ටම	රියදුරු සේවය	05	0	08
	කාර්යාල සේවක සේවය	07	04	
එකතුව		48	21	27

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති අයුරු

රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය හෝ නොමැතිව කටයුතු කිරීමට සිදුවීම නිසා කාර්යක්ෂමව කටයුතු කිරීමට බාධා පැමිණීම මෙන්ම ආයතනයේ කටයුතු වල විනිවිදභාවයට නිරවද්‍යතාවයට මෙන්ම ගුණාත්මකභාවයට ද බලපෑම් එල්ලවිය හැකිය.

කෙසේ වුව ද ඉහත තත්වයන් වළක්වා ගැනීම සඳහා විකල්පයක් වශයෙන් විශ්‍රාමික නිලධාරීන්ගේ සේවය කොන්ත්‍රාත් පදනමින් ලබා ගැනීමට කටයුතු කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහන	පුහුණු කරන ලද කාර්යය මණ්ඩල සාමාජික සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	මුළු ආයෝජනය (රුපියල්)		වැඩසටහනෙහි ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩමුළුව (2025.06.19 සහ 2025.06.20)	02	දින 02	26000/=		දේශීය	වඩා හොඳ සේවා සැපයීමක් සඳහා කුසලතා වැඩි දියුණු කිරිම තුලින් ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට
02	ප්‍රසම්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින 03	18000/=		දේශීය	
03	Certificate Course in Effective Instructing Attorneys	01	දින 09	18500/=		දේශීය	
04	රියදුරන් සහ කාර්යාල කාර්ය සහයකයන් සඳහා විනය හා කාර්යාලීය ආචාර්ය විධි පිළිබඳ පුහුණු වැඩමුළුව	02	දින 02	26000/=		දේශීය	
05	Advanced Microsoft Excel Training for Data Analysis	01	දින 03	21000/=		දේශීය	
06	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ වැඩමුළුව	25	දින 01	6000/=		දේශීය	
07	ප්‍රසම්පාදන පිළිබඳ පුහුණු වැඩමුළුව	25	දින 01	6000/=		දේශීය	
08	කාර්යාල ක්‍රම හා කාර්යාල විනය පිළිබඳ පුහුණු වැඩමුළුව	25	දින 01	6000/=		දේශීය	
09	නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ පුහුණු වැඩමුළුව	25	දින 01	6000/=		දේශීය	
10	වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩමුළුව (2025.12.16 සහ 2025.12.17)	02	දින 02	26000/=		දේශීය	

07. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දී තිබීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංගය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA /1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමණාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම	2025.04.10 සහ 2025.12.10 දින විගණන කමිටු රැස්වීම් 2ක් පවත්වා ඇත.		2026 වර්ෂය සඳහා නියමිත පරිදි පැවැත්වීමට කටයුතු යොදා ඇත.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධිකරණ නිලධාරියකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අදාළ නොවේ.		

අංකය	අදාළකර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත්කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.			ගර්භිත වාහන නොමැත.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙනයාම.			අදාළ නොවේ
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.			අනතුරු සිදු වී නොමැත.
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.			මාසික කුලී පදනම මත ලබාගත් වාහන පමණක් ඇත
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාළ නොවේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මසක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සළසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ	එම චක්‍රලේඛයෙහි මෙම කොටස අවලංගු කර ඇත.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		.
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		